# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2019/11 - 2017 මැයි මස 16 වැනි අඟහරුවාදා - 2017.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මහානගර හා බස්නාහිර පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛන අංක I හා II විස්තර කර ඇති ඉඩම් කොටස් පිළිවෙලින්, රජයේ සේවක මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීම හා මහානගර හා බස්නාහිර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විද්‍යා හා තාක්ෂණ නගරයක් ඉදිකිරීම ආශ්‍රිත නාගරික සංවර්ධන කටයුතු සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 මැයි මස 09 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය I

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහානගර සභා සීමාවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, බොරැල්ල ගමේ (කොට්ඨාස අංක 33, බොරැල්ල උතුර) පිහිටියා වූ ද බොරැල්ල, පෙළෙන්ගස්තුඩුව පාරේ වරිපනම් අංක 265 (කොටසක්) වන සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො/ ඩීඑස්ම් / 2015 / 102 සහ 2016.03.23 දිනැති අනුරේඛණයෙහි කැබලි අංක ''ඒ'' මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0 රූඩ්. 01 පර්. 0.31 ක් (හෙක්. 0.1020) පමණ වන ඉඩම් කොටසට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පෙළෙන්ගස්තුඩුව පාර, පෙළෙන්ගස්තුඩුව පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි ඉඩම, වරිපනම් අංක 249 දරන ඉඩම සහ කො. 8426 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1 ; |
| *නැගෙනහිරට* | : | කො. 8426 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1 ; |
| *දකුණට* | : | සර්පන්ටයින් පාරේ වරිපනම් අංක 10/8 සහ 10/9 දරන ඉඩම් ; |
| *බටහිරට* | : | පෙළෙන්ගස්තුඩුව පාර. |

1A - G 25549 — 17 (2017/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිවත්තුඩුව උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මූනමලේ ගමේ පිහිටි ඉඩමට අදාළව ඇඳ ඇති දළ සැලැස්මේ කැබලි අක්ෂර ''ඒ'' ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 30 රූඩ්. 00 පර්. 00 පමණ වූ කතෝනිස්වත්ත නැමති ඉඩමට මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පිටඇල, ගෝනවල කුඹුර, ගෝනවල පාර හා ගංගානි ලෑන්ඩ් සේල් ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ගංගානි ලෑන්ඩ් සේල් ඉඩම හා මූනමලේවත්ත පාර ; |
| *දකුණට* | : | සාවිකා ඔටෝමේෂන් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම, වරිපනම් අංක 205/2/8B අයත් අයි. ඩබ්. ප්‍රේමලතා, කම්මල පාර, වරිපනම් අංක 205/4/2, වරිපනම් අංක 205/1 අයත් කේ. ජී. පියසේන කුඹුර හා පිටඇල ; |
| *බටහිරට* | : | වරිපනම් අංක 205/2/8B අයත් අයි. ඩබ්. ප්‍රේමලතා, කම්මල පාර, වරිපනම් අංක 205/4/2, වරිපනම් අංක 205/1 අයත් කේ. ජී. පියසේන, කුඹුර, පිටඇල හා ගෝනවල කුඹුර. |

06 - 47

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.